GMOA

ESTABLISHED IN
1926
TU No. 291

Tel : 2580886 / 0714 999555
Fax : 2503586 / 4518668
Web : www.gmoa.lk
Email : gmoasrilanka@sltnet.lk

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No. 275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

## පුවත්පත් නිවේදනය

## ඖෂධ පිළිබඳ තොරතුරු ලබාගැනීමේ ජාතික ක්‍රමවේදයක ආරම්භය

රජයේ වෛද්‍ය නිළධාරීන්ගේ සංගමය රෝගී ප්‍රතිකාර සේවයේ දියුණුව සහතික කිරීම සඳහා, සෑම විටම කටයුතු කරන ලද අතර, ඒ සඳහා උපරිම දායකත්වය සපයා ඇත. රෝගී ප්‍රතිකාර සේවය උසස් කිරීම සඳහා ඖෂධ පිළිබඳ විස්තර විධිමත්ව හා විශ්වාසනීයව වෛද්‍යවරුන්ට සහ අනෙකුත් කාර්යයමණ්ඩලයන්ට මෙන්ම රෝගීන්ටද දැනගැනීමේ ක්‍රමවේදයක අවශ්‍යතාවය අප විසින් සෑම විටම අවධාරණය කර ඇත. ජාතික අවශ්‍යතාවයක් වන මෙම කාරණය සම්බන්ධව මූලික සාකච්ඡා දැනටමත් සෞඛ්‍ය අමාත්‍යංශය සමග ආරම්භ කර ඇත. මෙහි ආරම්භක පියවරක් ලෙස එක්සත් රාජධානියේ පශ්චාත් උපාධි පුහුණුව ලබන වෛද්‍යවරුන්ගේ සහයෝගය මත රජයේ සියලුම රෝහල් සඳහා British National Formulary ( ඖෂධ පිළිබඳ විස්තර අඩංගු ග්‍රන්ථය) බෙදා දීමේ උත්සවය 2011 අගෝස්තු මස 4 වන දින සෞඛ්‍ය අමාත්‍යංශ ශ්‍රවණාගාරයේ දී උදෑසන 10.00 ට උත්සවාකාරයෙන් ආරම්භ කරනු ලැබේ. මේ සඳහා ඔබගේ කාරුණික සහභාගීත්වය අපේක්ෂා කරමු.

රජයේ වෛද්‍ය නිළධාරීන්ගේ සංගමය - 2011/08/02